උඩපළාත ප්‍රාදේශීය සභාව

<u>**මහනුවර දිස්ත්‍රිකය**</u>

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 10 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.

---------

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට උඩපළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාළව 2015 වර්ෂයේදි ගෙවන ලද රු.49,475ක වියදම් වෙනුවෙන් ණය හිමි ප්‍රතිපාදන ගිණුම්වල සලසා නොතිබුණි.

(ආ). ඉකුත් වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේ දී ගෙවන ලද එකතුව රු.560,232 ක් වූ නිතිඥ ගාස්තු හා වාහන අළුත්වැඩියා වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් සේ සලකා ගිණුම් ගත කර තිබුණි.

(ඇ). WPPF- 7352 ඩබල් කැබ් රථයේ 2015 වර්ෂයේ රක්ෂණ වාරිකය වෙනුවෙන් ගෙවන ලද රු.74,988ක් සමාලෝචිත වර්ෂයේ වියදම් සේ සලකා ගිණුම්ගත කර තිබුණි.

(ඈ). ඉකුත් වර්ෂයේ හුණුගල ක්‍රීඩාපිටිය සහ බුදුමැදුර පිහිටි ඉඩම මැන සභාව වෙත පවරා ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ගෙවන ලද රු.13,440 ක මැණුම් ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණ අතර, එම වියදම් ප්‍රාග්ධනිත කරද නොතිබුණි.

(ඉ). බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් හිඟ බලපත්‍ර ගාස්තු ලේඛනයක් පවත්වා නොතිබුණු අතර, 2013 සහ 2014 වර්ෂවලට අදාළව පුස්සැල්ලාව උපකාර්යාලය මහින් පමණක් අයවිය යුතු රු.205,650 ක බලපත්‍ර ගාස්තු ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

(ඊ). 2011 හා 2012 වර්ෂ වෙනුවෙන් ගෙවන ලද රු.154,560 ක විගණන ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදම සේ සලකා ගිණුම්ගත කර තිබුණි.

(උ). 2013 ජුනි සිට දෙසැම්බර් මස දක්වා මුද්දර ගාස්තු උපලේඛන සකස් කිරීමට අදාළව ගෙවිය යුතු රු.11,525 ක මුදල් සමාලෝචිත වර්ෂයේ වියදම සේ සලකා ගිණුම්ගත කර තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම.

ගිණුම් විෂයයන් 03ක අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.116,036,194ක් වූ ගණුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

1.3.3 නීති ,රීති රෙගුලාසිවලට අනුකූල නොවීම.

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති රීති රෙගුලාසි හා කළමණාකරන තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | |
| රීති 59 - 66 | සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ ආදායම් පරිපාලක විසින් සභා බල ප්‍රදේශය තුළ තිබෙන කර්මාන්ත ඇතුළු වෙළඳ ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණය කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය | |
| XXIV පරිච්ඡේදය | සේවකයන් 11 දෙනෙකු ගෙන්2010 වර්ෂයට පෙර සිට පැවැත එන අයවිය යුතු රු.136,740 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.16,194,657 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.23,911,696 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.7,717,039 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

2.2 ආදායම් පරිපාලනය

------------------------

2.2.1 බදු කුලී

-----------

(අ) පාරදෙක ගමෙහි පිහිටි අංක 01 හා 02 ව්‍යාපාර ස්ථාන දීර්ඝ කාලීනව වසා දමා තිබුණු අතර, එම ව්‍යාපාර ස්ථාන අළුත්වැඩියා කර බදු දීමට කටයුතු කර නොතිබුණි. අංක 03 දරන ව්‍යාපාර ස්ථානය 2014 ජූලි මස සිට වසා දමා ඇති බැවින් අයවිය යුතු රු.7,560 ක හිඟ ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දොළුව පොදු වෙළඳපලේ අංක 07,08,11,12 දරන කඩ කාමර 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා බදු දීමට කටයුතු කර නොතිබූ බැවින්, කඩ කාමර බදු දීමෙන් අයකර ගත හැකිව තිබූ රු.240,000 ක මුදලක් සභාවට අහිමි වී තිබුණි.

2.2.2 සම්ප්‍රේෂණ කුළුණු සඳහා බදු මුදල් අයකර නොගැනීම

------------------------------------------------------------

ආදායම් පරික්ෂකගේ භෞතික පරීක්ෂණ වාර්තාව අනුව සම්ප්‍රේෂණ කුළුණු 18ක් හඳුනාගෙන තිබුණු අතර, එම කුළුණු සඳහා බදු මුදල් අය කර නොතිබුණි. තවද, 2013 හා 2014 වර්ෂවලට අදාළව පෞද්ගලික ආයතන 03 කින් රු.78,200 ක් ලැබිය යුතු ලෙස ගණනය කර තිබුණද, ලැබිය යුතු මුදල් ගිණුම්වලින් හෙළිදරව් කර නොතිබුණි.

2.2.3 දැන්වීම් පුවරු ගාස්තු

-----------------------

උඩපළාත ප්‍රාදේශිය සභාවේ ලේකම්ගේ 2015 ජුනි 15 දිනැති ලිපිය පරිදි පුද්ගලික සමාගමක් මගින් සවිකර ඇති ස්ථිර දැන්වීම් පුවරු 26 ක් වෙනුවෙන් ලැබිය යුතු රු.103,000 ක් සහ තවත් රු.87,150 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි .

2.2.4 ඉඩම් බදු

----------

ඉඩම් බදු ලේඛනය අනුව 2014 දෙසැම්බර් 31 ට රු.24,048 ක හිඟ ශේෂයක් විය.

2.2.5 ජල ගාස්තු

------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i). සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.2,011,055ක හිග ජල ගාස්තු මුදලක් පැවති අතර, ඉන් අවුරුදු 01ක කාලය ඉක්මවා තිබූ ශේෂ වල වටිනාකම රු.1,739,769ක් වී තිබුණි. මෙම හිඟ මුදල් අයකර ගැනීමට විධිමත් වැඩ පිළිවෙලක් අනුගමනය කර නොතිබුණි.

(ii). ජල මනු රහිතව පාරිභෝගික ස්ථාන 411 ක් සඳහා ජල සැපයුම් ලබාදීමෙන් සභාවට අයකර ගත හැකි ආදායම සීමා වී තිබුණි.

2.2.6 නිවාස කුලී.

---------------

2014 දෙසැම්බර් 31 දිනට හිග නිවාස කුළී රු.16,802 ක් වූ අතර, 2008 නොවැම්බර් මස විශ්‍රාම ගිය නිලධාරීයෙකුගෙන් අය කළයුතු රු.8,460 ක හිග කුළිය දඅය කර ගෙන නොතිබුණි . මිය ගිය සේවකයෙකුගෙන් 2015 ජූලි 31 දිනට රු.15,252 ක් තවදුරටත් අය වියයුතුව තිබුණි.

2.2.7 උසාවි දඩ

-----------

2011 වර්ෂයට අදාළව ලැබිය යුතු රු.28,250 ක උසාවි දඩ මුදල් 2014 වර්ෂයට අදාළව ලැබිය යුතු රු.446,833 ක මුදල් සහ සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා ගම්පොල දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලැබිය යුතු රු.500,000 ක ඇස්තමේන්තු වටිනාකමට අදාළ මුදල් නිශ්චිතව ගණන් බලා ගෙන්වා ගැනීමට 2015 ජූලි මස වන විටත් කටයුතු කර ගෙන නොතිබුණි.

2.2.8 බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු

-----------------------------------

බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු අයවිය යුතු ස්ථාන පිළිබඳව 2013 හා 2014 වර්ෂයන්හි සමීක්ෂණයක් මඟින් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, අවසාන වරට සමීක්ෂණය කළ 2012 වර්ෂයේ බලපත්‍ර ලේඛනය පදනම් කරගෙන බදු හා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය.

------------------------------

3.1 කළමණාකරන අකාර්යක්ෂමතා.

-----------------------------------

(අ). පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් නියමිත පරිදි ප්‍රේෂණය කර නොතිබීම හේතුවෙන්, 2014 දෙසැම්බර් 31 දිනට රු.2,750,621 ක මුදලක් ගෙවිය යුතුව තිබුණි.

(ආ). ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරිමේ ජාතික වැඩසටහන යටතේ ප්‍රාදේශිය සභාවට ලබා දී තිබුණු රුපියල් මිලියන 5 ක මුදලින් රු. 4,279,126 ක මුදලක් අදාළ කර්මාන්ත ඉටු නොකර ආපසු යවා තිබුණි.

(ඇ) 1993 වර්ෂයේ ස්ථාන මාරුවී 2006 වර්ෂයේ විශ්‍රාම ගිය ආදායම් පරික්ෂකවරයා සභාවට අයත් නිවසේ පදිංචි වී සිටි අතර, අදාළ නිවස ආපසු භාර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1987 ජනවාරි 05 දිනැති අංක කේ/857 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව රජයේ නිවාස සඳහා අයකරන ආර්ථික කුලිය වාර්ෂිකව තක්සේරු කළයුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර , සභාව සතු නිවාස 13 ක් සඳහා 2012 වර්ෂයේ තක්සේරු කරන ලද කුලිය මේ වන විටද අයකරමින් පවති.

3.2 මානව සම්පත් කළමනාකරණය

---------------------------------------

උඩපළාත ප්‍රාදේශීය සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට අනුමත හා තත්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ පරීක්ෂා කිරීමේදී ද්විතියික මට්ටමේ පුරප්පාඩු 13 ක් සහ ප්‍රාථමිකසේවයේ තනතුරු 06 ක පුරප්පාඩු 13 ක් පැවැති බව නිරීක්ෂණය වූ අතර,එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි. ප්‍රාථමික සේවයේ පුස්තකාල සේවක තනතුරේ නිලධාරීන් 02 ක් අතිරික්තයක් ද පැවතුණි.

3.3 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්.

--------------------------------------------

රු.115,500ක් වටිනා ට්‍රැක්ටර් ටයර් 06ක් හා වටිනාකම් හඳුනා නොගත් යතුරුපැදියක් 2010 වර්ෂයේ සිට නිෂ්කාර්ය හා ඌන උපයෝජිතව පැවතුණි.

3.4 අවිධිමත් ගනුදෙනු

----------------------

ක්‍රීඩා සංවර්ධන අමාත්‍යාංශයෙන් එවන ලද පරිපාලන වියදම්වලින් එම අංශයේ නිලධාරින්ට දීමනා ගෙවීමට 2012 සැප්තැම්බර් 25 දිනැති මහා සභා රැස්වීමේදී තීරණයන් ගෙන තිබුණද, ඊට පටහැනිව සභාවට ලැබුණු සියළු පරිපාලන වියදම්වලින් රු.326,000 ක මුදලක් කිසිදු පදනමකින් තොරව සභා අරමුදලින් වැටුප් ලබන නිලධාරින්ට දීමනා ලෙස ගෙවා තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

------------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු සමඟ තථ්‍ය ආදායම් හා වියදම් සැසඳීමේ දි , ආදායම් විෂයයන් 5ක සියයට 19 සිට සියයට 33 දක්වා ද වියදම් විෂයයන් 06 ක සියයට 44 සිට සියයට සියය ඉක්මවා විචලනයන් පැවතුණි. සමාලෝචිත වර්ෂයේ සභාව මඟින් පිළියෙළ කර තිබූ අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ අවධානය යොමු කරනු ලැබේ. .

(අ) ගිණුම්කරණය.

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය